**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව - සති පාසල**

**01. ශ්‍රේණිය : 11 විෂයය: ගෘහ ආර්ථික විද්‍යාව සතිය : 19 වන සතිය**

**02. පාඩම හෝ ඒකකය: නව යෞවන අවධියේ සංවර්ධනය**

**03. මෙම පාඩම තුලින් ලබා ගත හැකි ඉගෙනුම් එල:**

- නව යෞවන අවධියේදී මුහුණ පෑමට සිදුවන වෙනස්වීම් වලට අනුවර්තනය වෙයි යන නිපුණතාවයට අදාලව විභාග ප්‍රශ්න වලට සාර්ථකව පිළිතුරු සපයයි.

04. ශිෂ්‍යයා කල යුතු කාර්යයන්:

ඔබ අධ්‍යයනය කර ඇති ගෘහ ආර්ථික විද්‍යාව පෙළ පොතේ දොළොස් වන පාඩම ඇසුරින් පහත පුනරීක්ෂණ අභ්‍යාස සඳහා පිළිතුරු සපයන්න.

01. i. යොවුන් වියේ දරුවෙකුගේ කායික වර්ධනයේ දී දැකිය හැකි පොදු ලක්ෂණ තුනක් ලියන්න.
ii. වයස අවු. 18 ට අඩු ගැහැණු දැරිවියක් ගර්භණීභාවයට පත් වුවහොත්, එහිදී ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල මොනවා ද?
iii. 'ආර්තවහරණය' යනු කුමක්දැයි හඳුන්වා, එයට හේතුවන කරුණු කෙටියෙන් පැහැදිලි කරන්න.

02. i. "යහපත් ප්‍රජනන සෞඛ්‍ය පුරුදු" තුනක් ලියන්න.
ii. "ලිංගිකව සම්ප්‍රේෂණයවන ආසාදනවල" ලක්ෂණ තුනක් සඳහන් කරන්න.
iii. කෙටි සටහන් ලියන්න.

- HIV
- රංවු ලෑදියාව

03. i. ලිංගිකව සම්ප්‍රේෂණයවන රෝග කිහිපයක් ඇත. ඉන් තුනක් නම් කරන්න.
ii. නව යොවුන් වියේ කායික වර්ධනය සිදුවීමේ දී ඇති වන ලක්ෂණ තුන බැගින් ගැහැණු, පිරිමි වශයෙන් වෙන් වෙන් ව දක්වන්න.
iii. "නව යොවුන් වියේ දී, යෞවනයා, සමාජයට යොමුවීමට තදබල උත්සාහයක යෙදෙමින්, සමාජයීය වර්ධනයේ බොහෝ කඩ ඉම් පසු කරයි." මෙම ප්‍රකාශය කරුණු හතරකින් පැහැදිලි කරන්න.

05. ඉහත අභ්‍යාස සඳහා අවශ්‍ය තොරතුරු තව දුරටත් අධ්‍යයනය කිරීම සඳහා අන්තර්ජාලය හා සම්බන්ධ වන්න.

- https://www.youtube.com/watch?v=Mux4kLDerho
- https://www.youtube.com/watch?v=NAzJvLOuwJY
- https://www.youtube.com/watch?v=u-nHpQcHsJk